**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීමෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයනගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිවිසුම් හා බැඳුම්කර කඩකළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.3,225,207 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු වටිනාකම UPF අරමුදලින් අයකරගෙන ඇති අතර ඉතිරි මුදල මාසිකව අයකර ගැනීමට කටයුතු යොදා ඇත .අනෙක් නිලධාරියා සහ ඇයගේ ඇපකරුවන්ට එරෙහිව පවරා ඇති නඩුව ක්‍රියාත්මක වෙමින් පවතින බව. | කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයට ලැබිය යුතු ශේෂවල ඇතුළත් රු.16,692,072ක ශිෂ්‍යාධාර ශේෂයක් වර්ෂ ගණනාවක සිට නිරවුල් නොවී පැවතුණි. | ඉතා දිගු කලක පටන් පවත්නා මෙම ශේෂයන් පූර්ණ විශ්ලේෂණයකට ලක්කර සුදුසු ක්‍රියාමාර්ගයක් 2023 වර්ෂයේදී සිදු කිරීමට උපදෙස් දෙන ලද බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 2 ත් වර්ෂ 11 ත් අතර කාලයක සිට පවතින එකතුව රු.61,598,913 ක් වූ තැන්පතු හා රඳවාගත් ශේෂ හා වර්ෂ 2 කට වඩා පැරණි එකතුව රු.43,472,497 ක් වූ ගෙවිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි | මෙම ගිණුම් විශ්ලේෂණය කර පැරණි ශේෂයන් හඳුනාගෙන අදාල කටයුතු 2023 ගිණුම් වර්ෂය තුලදී සිදුකිරිමට කටයුතු කරන බව. | අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු සිදුකළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XX වන පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස එකතුව රු.670,389,801 ක් ගෙවා තිබුණි. | වැටුප් හා දීමනා ගෙවීමේදී අදාල සේවය ලබාගත් බවට අංශ ප්‍රධානියාගේ සහතිකයක් ලබාගැනීමෙන් පසුව ගෙවීම් සිදුකර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2004/පුස/1(2016- සංශෝධිත) චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ 2022.12.31 දිනට රු.3,573,329 ක් වූ පුස්තකාල ද්‍රව්‍ය සම්බන්ධයෙන් 2019 වර්ෂයෙන් පසු වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි. | පුස්තකාල තොග සංගණනය පවත්වා ගෙන යෑම සඳහා පත් කර ඇති කමිටුවේ සභාපති විසින් සංගණනය පැවැත්වීම සඳහා මේ වන විට සැලසුම්කරමින් සිටින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.85,552,337 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.257,427,107ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.342,979,444 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන හා වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන අඩුවීම සහ ගිවිසුම්ගත සේවා වියදම සහ ප්‍රග්ධන වත්කම් වැඩිදියුණු කිරීමේ වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ සමස්ථ ආදායමෙන් සියයට 96 ක් පමණ රජයේ ප්‍රදානවලින් සමන්විත වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන සියයට 6 කින් අඩු වී තිබුණි. තවද වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන සියයට 100 කින් පහළ ගොස් තිබුණි. එසේම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආයෝජන මත පොලී ආදායම සියයට 73 කින් ද ගිවිසුම්ගත සේවා වියදම සියයට 77 කින් ද ප්‍රග්ධන වත්කම් වැඩිදියුණු කිරීමේ වියදම සියයට 596 කින්ද ඉහළ ගොස් තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

### (අ) ජංගම අනුපාතය

ජංගම අනුපාතය අවම වශයෙන් 2:1 ලෙස පැවතිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී එය 0.72:1 ක් ව පැවතීම නිසා කාරක ප්‍රාග්ධනය කාර්යක්ෂමව මෙහෙයවීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය.

### (ආ) ක්ෂණික අනුපාතය

පසුගිය වර්ෂයේ ක්ෂණික අනුපාතය 1.9:1 ක් ව පැවති අතර සමාලෝචිත වර්ෂයේ එම අනුපාතය 0.7:1 ක් වී තිබුණි.

### (ඇ) ඒක ශිෂ්‍ය පිරිවැය

පසුගිය වර්ෂයේ රු.355,629 ක් වූ ඒක ශිෂ්‍ය පිරිවැය ප්‍රවර්තන වර්ෂයේ දී රු.434,072ක් දක්වා එනම්, සියයට 22 කින් ඉහල ගොස් තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ වටිනාකම රු.1,022,650,000 ක් වූ ඉඩම් කැබලි 03ක් විශ්වවිද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීත් අපොහොසත් වී තිබුණි. | එක් ඉඩමක දීමනා පත්‍රය ජනාධිපතිතුමාගේ අත්සන් සඳහාත් අනෙක් ඉඩමේ දීමනා පත්‍රය ලියාපදිංචි කටයුතු කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙතත් යොමු කර ඇති බව. එක් ඉඩමක් පවරා ගැනීමට අවශ්‍ය නිර්දේශ ලබාගෙන මේ වන විට සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය ඉදිරි කටයුතු කරමින් පවතින බව. | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආපනශාලා උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.7 ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීමේදී පිරිවිතර විස්තරාත්මක ඇගයීම් නොකිරීම හේතුවෙන් පිරිවිතර වලට අනුකූල නොවූ රු.1,018,500 ක් වටිනා උපකරණ 3 ක් මිලදී ගෙන තිබුණි. | සුලු බැහැරවීම් වැඩවල විෂය පථයට ,ගුණාත්මක භාවයට හෝ කාර්යයසාධනයට ප්‍රමාණවත් බලපෑමක් ඇති නොකරන බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ ලබා දෙන ලද බව . | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම තුල හඳුනාගෙන තිබුණු ක්‍රියාකාරකම් 300ක් අතරින් ක්‍රියාත්මක නමුත් අරමුණු කරා ළඟා නොවුනු ක්‍රියාකාරකම් 106 ක්ද ක්‍රියාත්මක නොවූ ක්‍රියාකාරකම් 108 ක්ද පැවතුණි. අරමුණු කරා ළඟා වී තිබුණේ ක්‍රියාකාරකම් 86 ක් සම්බන්ධයෙන් පමණි. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | ක්‍රියාකාරී සැලැස්මෙහි අරමුණු ළඟා කර ගැනීම කාලීනව හා කාර්යක්ෂමව ඉටු කර ගත යුතුය. |